**පළාත් පාලනය වැඩිදියුණු කිරීමේ ආංශික ව්‍යාපෘතිය (පුරනැගුම) - 2020**

-----------------------------------------------------------------------------------

පළාත් පාලනය වැඩිදියුණු කිරීමේ ආංශික ව්‍යාපෘතියේ (පුරනැගුම) 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2011 ඔක්තෝබර් 21 දින එළඹී අංක 2790-එස්ආර්අයි (එස්එෆ්) දරන ණය ගිවිසුමේ IV ව්‍යවස්ථාව සහ 2016 නොවැම්බර් 02 දින එළඹී අංක 3431 - එස්ආර්අයි (එස්එෆ්) දරන ණය ගිවිසුම සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

-----------------------------------------------------------------------

ව්‍යාපෘතියේ ණය ගිවිසුම්වලට අනුව, එවකට පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වර්තමානයේ පළාත් සභා හා පළාත් පාලන කටයුතු පිළිබඳ රාජ්‍ය අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර පළාත් 07 හි පළාත් සභා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. ව්‍යාපෘතියේ අරමුණ වනුයේ, ගිණුම් කටයුතුභාවය හා මූල්‍යමය හා තාක්ෂණිකව ශක්තිමත් වූ පළාත් පාලන ආයතන මගින් දියුණු පළාත් පාලන යටිතල පහසුකම් හා කාර්යක්ෂම සේවා සැපයීමක් ඉටුකර ගැනීමයි. ව්‍යාපෘතියේ පසුණය මුදලෙහි අරමුණු වනුයේ දැඩි ලෙස වකුගඩු රෝගයෙන් බලපෑමට ලක්වූ ශ්‍රී ලංකා පළාත් 07 හි අඩු දියුණු ප්‍රදේශවල පළාත් පාලන ආයතන හා ජාතික ජල සම්පාදන හා ජලා පවහන මණ්ඩලයේ යටිතල පහසුකම් හා සපයන සේවා දියුණු කිරීම වේ. එම නිසා, ජල සැපයුම් පද්ධති, යටිතල පහසුකම්, මූලික සේවා සැපයීම් පිළිබඳ පළාත් පාලන ගැටලු පිළිබඳව අවධානය යොමු කිරීම අරමුණු වේ. ණය ගිවිසුම් අංක 2790 එස්ආර්අයි (එස්එෆ්) ප්‍රකාරව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 8,940කට සමාන එජඩො මිලියන 68.80 ක් වූ අතර ඉන් රු.මිලියන 7,670කට සමාන එජඩො මිලියන 59ක් මූල්‍යායනය කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව විසින් එකඟ වී තිබුණි. ඉතිරි ඇස්තමේන්තුගත පිරිවැය වූ රු.මිලියන 1,339.33කට සමාන එජඩො මිලියන 9.8ක් ශ්‍රී ලංකා රජය දායක වීමට එකඟ වී තිබුණි. පසු ණය ගිවිසුම් අංක 3431 එස්ආර්අයි (එස්එෆ්) අනුව, මුල් ව්‍යාපෘතියේ කාර්යසාධනය පුළුල් කිරීම සඳහා 2017 වර්ෂයේදී රු.මිලියන 8,700කට සමාන එජඩො මිලියන 60ක අතිරේක ණය මුදලක් ලබාගෙන තිබුණි. ශ්‍රී ලංකා රජයේ රු.මිලියන 1,071.47කට සමාන එජඩො මිලියන 7.8ක දායකය සමග ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 9,771.47කට සමාන එජඩො මිලියන 67.8ක් වේ. ව්‍යාපෘතිය එහි කටයුතු 2012 ජූලි 01 දින ආරම්භ කරන ලද අතර 2015 ජුනි 30 වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේවෙතත්, ව්‍යාපෘතියේ කටයුතු නිම කිරීමේ දිනය 2021 දෙසැම්බර් 31 දක්වා දීර්ඝ කර තිබුණි.

**1.3 මතය**

-------

ව්‍යාපෘතියේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම් ප්‍රකාශය සහ එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.4 මතය සඳහා පදනම**

--------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදි.

**2.** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.1** **නීති, රීති, රෙගුලාසිවලට අනුකූල නොවීම**

| **නීති, රීති රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** | **කළමනාකරණයේ ප්‍රතිචාරය** | **විගණකගේ නිර්දේශය** |
| --- | --- | --- | --- |
| 2019 මාර්තු 15 දිනැති 01/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 9.3 වගන්තිය | ව්‍යාපෘති සමාලෝචන කමිටු රැස්වීම් මාස 02 කට වරක් පැවැත්වීමට අවශ්‍ය වේ. කෙසේවෙතත්, සමාලෝචිත වර්ෂය තුළ රැස්වීම් වාර 03 ක් පමණක් පවත්වා තිබුණි. | අදහස් දක්වා නොමැත. | චක්‍රලේඛ උපදෙස්වලට අනුව ව්‍යාපෘති සමාලෝචන කමිටු රැස්වීම් පැවැත්වීමට අවශ්‍ය වේ. |

## 3 භෞතික කාර්යසාධනය

---

### 3.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ භෞතික ප්‍රගතිය

---

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ සැලැස්මට අනුව, ව්‍යාපෘතිය පළාත් 07 ක පළාත් පාලන ආයතන 105 ක ඔවුන්ගේ යටිතල පහසුකම් අවශ්‍යතා වැඩිදියුණු කර ගැනීමට සහයෝගය දක්වා තිබුණු අතර, 2017 වර්ෂය අවසාන වන විට අදාළ පළාත් පාලන ආයතන 178ක සංවර්ධන කටයුතු සම්පූර්ණ කර තිබුණි. තවද, අතිරේක ණය පහසුකම් යටතේ පළාත් පාලන ආයතන 29 ක ජල සම්පාදන ව්‍යාපෘති 29 ක්, ඉදිකිරීම් කටයුතු 35 සිදු කිරීමට සැලසුම් කර තිබුණු අතර, ඉන් පෙර වර්ෂය අවසානය වන විට ජල සම්පාදන ව්‍යාපෘති 03ක් හා යටිතල පහසුකම් ව්‍යාපෘති 11ක් සම්පූර්ණ කර තිබුණි. සමාලෝචිත වර්ෂය තුළදී ජල සම්පාදන ව්‍යාපෘති 08ක් සහ යටිතල පහසුකම් ව්‍යාපෘති 12ක කටයුතු සම්පූර්ණ කර තිබුණි. ඊට අමතරව මාස 6කට වඩා ප්‍රමාද ව්‍යාපෘති 17ක් සහ ප්‍රමාදයන් සඳහා හේතු පහත දැක්වේ.

#### 3.1.1 උප ව්‍යාපෘති නිම කිරීමේ ප්‍රමාදයන්

---

පහත දැක්වෙන නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | ක්‍රියාකරකම | නිම කිරීමට සැලසුම් කළ දිනය | ප්‍රමාදය (මාස) | ප්‍රමාදයට හේතුව |
|---|---|---|---|---|
| (අ) | නුවර වැව ජල පිරිපහදුවේ ධාරිතාව වර්ධනය කිරීම - අනුරාධපුර ප්‍රාදේශීය සභාව | 2020 මාර්තු 24 | 09 | කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්යසාධනය |
| (ආ) | සේවාගම ඇල මාර්ග 03 ප්‍රදේශය වෙත නල මාර්ග පුළුල් කිරීම සහ සේවාගම ජල කුළුණ දක්වා ප්‍රධාන සම්ප්‍රේෂණ මාර්ග පුළුල් කිරීම - තමන්කඩුව ප්‍රාදේශීය සභාව | 2020 පෙබරවාරි 24 | 10 | -එම- |
| (ඇ) | නිකවැරටිය ජල සම්පාදන යෝජනා ක්‍රමය පුළුල් කිරීම - අඹන්පොල ප්‍රාදේශීය සභාව | 2019 දෙසැම්බර් 31 | 12 | අහිතකර ලෙස කොවිඩ් 19 බලපෑම සිදුවිය. |
| (ඈ) | දඹුල්ල ග්‍රාමීය ප්‍රදේශ සහ කණ්ඩලම සඳහා ජල සම්පාදනය ක්‍රමය පුළුල් කිරීම | 2020 ජුනි 30 | 06 | -එම- |
| (ඉ) | ඉනාමළුව සහ කිතුල්හිටියාව සඳහා ජල සම්පාදන පුළුල් කිරීමේ යෝජනා ක්‍රමය ඉදිකිරීම | 2020 මැයි 01 | 08 | -එම- |
| (ඊ) | සීගිරිය සහ හබරණ ප්‍රදේශ සඳහා ජල සම්පාදන පුළුල් කිරීමේ යෝජනා ක්‍රමය ඉදිකිරීම. | 2020 මැයි 01 | 08 | -එම- |
| (උ) | ගලේවෙල සහ තිත්තවැල්ගොල්ල ජල සම්පාදන පුළුල් කිරීමේ යොජනා ක්‍රමය ඉදිකිරීම | 2020 ජුනි 30 | 06 | -එම- |

| | | | | |
|---|---|---|---|---|
| (ඌ) | කුරුසවත්ත පානීය ජල සම්පාදන ව්‍යාපෘතිය | 2019 සැප්තැම්බර් 01 | 16 | -එම- |
| (එ) | නාරම්මල ප්‍රාදේශීය සභා කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම - නාරම්මල ප්‍රාදේශීය සභාව | 2019 ජුලි 24 | 17 | -එම- |
| (ඒ) | කදිරන ශ්‍රවනාගාරය ඉදිකිරීම - කටාන ප්‍රාදේශීය සභාව | 2019 ජුනි 26 | 18 | කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්යසාධනය |
| (ඔ) | මහබාගේ වෙළඳපල සමඟ බහුකාර්ය ගොඩනැගිල්ල ඉදිකිරීම - වත්තල ප්‍රාදේශීය සභාව | 2019 පෙබරවාරි 01 | 11 | වැලිසර නාවික හමුදා කදවුර ආසන්නයේ පැවතීම හේතුවෙන් කොවිඩ් 19 බලපෑම සිදුවිය. |
| (ඕ) | පොල්ගොල්ල ප්‍රාදේශීය සභා කාර්යාලය, පුස්තකාලය සහ සෞඛ්‍ය මධ්‍යස්ථානය ඉදි කිරීම - කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාව | 2019 නොවැම්බර් 13 | 12 | ඉඩම් ගැටලු නිසා නැවත සැලසුම් කරන ලදි. |
| (ක) | කැකනදුර උප නගරය වැඩිදියුණු කිරීම - මාතර ප්‍රාදේශීය සභාව | 2020 මාර්තු 07 | 10 | ප්‍රාදේශීය සභාව විසින් ගොඩනැගිල්ලේ ඉදිරිපස කොටස ඉවත් කිරීම. |
| (ග) | වරකාපිටිය අදාහනාගාරය සහ අවමංගල්‍ය මල්ශාලාව ඉදි කිරීම - වැලිගම ප්‍රාදේශීය සභාව | 2020 මාර්තු 01 | 10 | සමාජ ගැටලු හේතුවෙන් ආරම්භය ප්‍රමාද විය. |
| (ච) | හෝමාගම නගරයේ පොදු වෙළඳපොළ සහ වැසිකිලි පේළිය සමග රථගාල ඉදිකිරීම | 2019 නොවැම්බර් 13 | 13 | කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්යසාධනය |
| (ජ) | වාද්දුව පොදු වෙළඳපොළ ඉදිකිරීම - පානදුර ප්‍රාදේශීය සභාව | 2020 මාර්තු 11 | 09 | -එම- |
| (ට) | නාහේන බහුකාර්යය ගොඩනැගිල්ල ඉදිකිරීම- කැළණිය ප්‍රාදේශීය සභාව | 2020 අප්‍රේ 30 | 08 | සමාජ ගැටලු හේතුවෙන් ආරම්භය ප්‍රමාද විය |

**කළමනාකරණයේ ප්‍රතිචාර**

2021 වර්ෂය අවසානයේදී බොහෝ කටයුතු නිම කරනු ලබන අතර ඉතිරි වැඩ කඩිනම් කිරීමට සියලුම ක්‍රියාමාර්ග ගෙන ඇත.

**විගණකගේ නිර්දේශ**

ව්‍යාපෘතිය අවශ්‍ය ප්‍රමිතිය සහතික වෙමින් නියමිත පරිදි සිවිල් කටයුතු නිම කිරීමට කොන්ත්‍රාත්කරු පෙළඹවීම අවශ්‍ය වේ.

### 3.1.2 ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් ආරම්භ කිරීමේ ප්‍රමාදයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | ක්‍රියාකාරකම් | පළාත් පාලන ආයතනය | වෙන් කිරීම රුපියල් මිලියන | ආරම්භ කළ දිනය | ප්‍රමාදය මාස | බලපෑම් | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|---|---|---|---|
| (අ) | කලා වැව පිරිපහදුව වැඩිදියුණු කිරීම | කලා වැව | 387 | 2019 මාර්තු 15 | 24 | (අ) අවසන් කිරීමේ ප්‍රමාදයන් ඇතිවේ.<br>(ආ) ඇස්තමේන්තුගත පිරිවැය ඉක්මවා යාම<br>(ඇ) ඉලක්කගත පාර්ශවයන්ට අපේක්ෂිත ප්‍රතිලාභ නොලැබේ. | අදහස් දක්වා නොමැත. | කොන්ත්‍රාත්වල පිරිවැය ඉහළ යාමේ හැකියාව සහ අනවශ්‍ය කාලදීර්ඝ කිරීම්වලින් වැළකීම අවශ්‍ය වේ. |
| (ආ) | දඹුල්ල ග්‍රාමීය ප්‍රදේශ සහ කණ්ඩලම සඳහා ජල සම්පාදනය ක්‍රමය පුළුල් කිරීම | දඹුල්ල කණ්ඩලම | 564 | 2019 පෙබරවාරි 28 | 28 | -එම- | -එම- | -එම- |
| (ඇ) | ඉනාමළුව සහ කිතුල්හිටියාව සඳහා ජල සම්පාදන පුළුල් කිරීමේ යෝජනා ක්‍රමය | ඉනාමළුව කිතුල්හිටියාව | 491.99 | 2019 ජනවාරි 02 | 22 | -එම- | අදහස් දක්වා නොමැත. | -එම- |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඉදිකිරීම | | | | | | | |
| (ඈ) | සීගිරිය සහ හබරණ ප්‍රදේශ සඳහා ජල සම්පාදන පුළුල් කිරීමේ යෝජනා ක්‍රමය ඉදිකිරීම | සීගිරිය හබරණ | 415 | 2019 ජනවාරි 02 | 21 | (අ) අවසන් කිරීමේ ප්‍රමාදයන් ඇතිවේ.<br>(ආ) ඇස්තමේන්තුගත පිරිවැය ඉක්මවා යාම<br>(ඇ) ඉලක්කගත පාර්ශවයන්ට අපේක්ෂිත ප්‍රතිලාභ නොලැබේ. | අදහස් දක්වා නොමැත. | කොන්ත්‍රාත්වල පිරිවැය ඉහළ යාමේ හැකියාව සහ අනවශ්‍යය කාලදීර්ඝ කිරීම්වලින් වැළකීම අවශ්‍ය වේ. |
| (ඉ) | බතලයාය සහ බෙලගන්වැව බෙදාහැරීම් ජාල සැපයීම් සහ එලීම | බතලයාය | 284 | 2019 ජනවාරි 17 | 21 | -එම- | -එම- | -එම- |
| (ඊ) | බතලයාය සහ බෙලගන්වැව පිරිපහදුව ඉදිකිරීම | බෙලගන්වැව | 506.7 | 2019 ජනවාරි 17 | 21 | -එම- | ලංසු ඇගයීමේ ක්‍රියාවලියේ ප්‍රමාදයන් | -එම- |
| (උ) | මහවිල කුරුසවත්ත පානීය ජල සම්පාදන ව්‍යාපෘතිය | මහවිල නාත්තන්ඩිය | 33 | 2019 මාර්තු 01 | 23 | -එම- | ලංසු ඇගයීමේ කටයුතු සිදු කරමින් පවතී | -එම- |
| (ඌ) | කැකුනදුර උප නගරය වැඩිදියුණු කිරීම | කැකුනදුර මාතර | 85.24 | 2019 මාර්තු 08 | 23 | -එම- | අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබීම බලාපොරොත්තුවෙන් සිටී. | -එම- |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| (එ) | ආදාහනාගාරය ඉදිකිරීම | වරකාපිටිය වැලිගම | 50 | 2019 මාර්තු 01 | 23 | -එම- | අදහස් දක්වා නොමැත. | -එම- |
| (ඒ) | පොදු වෙළඳපොල ඉදිකිරීම | වාද්දුව පානදුර | 63.42 | 2019 මාර්තු 11 | 23 | (අ) අවසන් කිරීමේ ප්‍රමාදයන් ඇතිවේ.<br>(ආ) ඇස්තමේන්තුගත පිරිවැය ඉක්මවා යාම<br>(ඇ) ඉලක්කගත පාර්ශවයන්ට අපේක්ෂිත ප්‍රතිලාභ නොලැබේ. | ආසියානු සංවර්ධන බැංකුවේ අනුමැතිය අපේක්ෂාවෙන් සිටී. | කොන්ත්‍රාත්වල පිරිවැය ඉහළ යාමේ හැකියාව සහ අනවශ්‍යය කාලදීර්ඝ කිරීම්වලින් වැළකීම අවශ්‍ය වේ. |
| (ඔ) | ජල සම්පාදන යෝජනා ක්‍රම | කරුවලගස්වැව ප්‍රාදේශීය සභාව | 324.77 | 2021 ජනවාරි 06 | 33 | එම | අදහස් දක්වා නොමැත. | -එම- |
| (ක) | පහල දීගල්ල ග්‍රාම නිලධාරී වසමට ජල සම්පාදන දීර්ඝ කිරීම | පහල දීගල්ල ප්‍රාදේශීය සභාව | 124.89 | 2020 නොවැම්බර් 16 | 43 | -එම- | අදහස් දක්වා නොමැත. | -එම- |

### 3.1.3 වැඩ ආරම්භ නොකළ ව්‍යාපෘතිවල කටයුතු

2017 අප්‍රේල් මසට පෙර පහත සඳහන් උප ව්‍යාපෘති ආරම්භ කිරීමට නියමිතව තිබුණද, 2021 ජුනි 30 දක්වා එම උප ව්‍යාපෘති ආරම්භ කර නොතිබුණි.

| | ක්‍රියාකාරකම් | ඇස්තමේන්තුගත වටිනාකම රු.මිලියන | බලපෑම් | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|---|
| (අ) | තණමල්විල සහ හම්බේගමුව බෙදාහැරීම් පද්ධතිය සඳහා ජල සම්පාදන යෝජනා ක්‍රමය | 1,270 | අපේක්ෂිත පාර්ශවයන් වෙත බලාපොරොත්තුවන ප්‍රතිලාභ නොලැබේ. | ජල මූලාශවල හිඟකම හේතුවෙන් | හැකි විගස උප ව්‍යාපෘති ආරම්භ කළ යුතු හෝ ව්‍යාපෘති පරිපාලන අත්පොතෙහි සඳහන් වැඩ සැලැස්ම සංශෝධනය කළ යුතුය. |
| (ආ) | තණමල්විල සහ හම්බේගමුව යෝජනා ක්‍රමය සඳහා ජල පිරිපහදු | 430 | -එම- | -එම- | -එම- |
| (ඇ) | මධ්‍යම පළාතේ ගැඹුරු නල ළිං පොම්පාගාර 3 ක් ඉදිකිරීම සහ ක්ලෝරීන් මිශ්‍රකරණය | 60 | -එම- | අදහස් දක්වා නොමැත | -එම- |
| (ඈ) | තණමල්විල සහ හම්බේගමුව යෝජනා ක්‍රමය සඳහා රදවා ගැනීමේ ටැංකි ඉදිකිරීම | 100 | -එම- | ජල මූලාශ්‍රවල හිඟකම හේතුවෙන් | -එම- |
| (ඉ) | කොටගල ප්‍රාදේශීය සහා ගොඩනැගිල්ල ඉදිකිරීම | 50 | -එම- | ජාතික සමාලෝචන කමිටුවේ උපදෙස් පරිදි ඉඩම් ගැටළු නිසා ඉවත් කර ඇත. | -එම- |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඊ) | ආගරපනත ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ල ඉදිකිරීම | 50 | අපේක්ෂිත පාර්ශවයන් වෙත බලාපොරොත්තුවන ප්‍රතිලාභ නොලැබේ. | ජාතික සමාලෝචන කමිටුවේ උපදෙස් පරිදි ඉඩම් ගැටළු නිසා ඉවත් කර ඇත. | හැකි විගස උප ව්‍යාපෘති ආරම්භ කළ යුතු හෝ ව්‍යාපෘති පරිපාලන අත්පොතෙහි සඳහන් වැඩ සැලැස්ම සංශෝධනය කළ යුතුය. . |
| (උ) | පස්සර ජල සම්පාදන ව්‍යාපෘතිය | 434.71 | -එම- | ගිවිසුම අත්සන් කර ඇත. | -එම- |

**3.2 නිශ්කාර්ය /භාවිතයට නොගත්/ ඌන උපයෝජිත සම්පත්**

**------------------------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**I ඉදිරිපස කාර්යාල පද්ධතිය සහ ඉ-පුරනැගුම මෘදුකාංගය**

| විගණන ගැටලුව | බලපෑම් | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| මධ්‍යම පළාතේ සහ උතුරු මැද පළාතේ පවතින පළාත් පාලන ආයතන 41 කින් ප්‍රාදේශීය සභා 17 ක් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණු ඉදිරිපස කාර්යාල පද්ධතිය සම්පූර්ණයෙන් භාවිතා කර නොතිබූ අතර ප්‍රාදේශීය සභා 16 ක් ඉහත පද්ධතිය ක්‍රියාත්මක නොකර විකල්ප නව මෘදුකාංග මිලදී ගෙන තිබුණි. | පළාත් පාලන ආයතනවල තොරතුරු සම්බන්ධ පද්ධතිය අපේක්ෂිත ඉලක්ක අත්පත්කර ගෙන නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, එම ප්‍රදේශයේ ජීවත්වන මහජනතාවට අපේක්ෂිත ප්‍රතිලාභ නොලැබේ. | ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක කිරීමේ වගකීම පළාත් ව්‍යාපෘති අධ්‍යක්ෂකවරුන් වෙත පවරා ඇත. | ව්‍යාපෘතිය, ප්‍රමාදයකින් තොරව පද්ධතිය සංවර්ධනය කිරීමට නිලධාරීන් පෙළඹ විය යුතුය. |

**II සිවිල් සහ ජලසම්පාදන ව්‍යාපෘති**

| | විගණන ගැටලු | බලපෑම් | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | වනාතවිල්ලුව ජල සම්පාදන පද්ධතිය | ප්‍රදේශයේ පවුල් 4,333 සඳහා ජලසම්පාදන පහසුකමේ නොමැත. | එකඟ වූ පරිදි ප්‍රාදේශීය සභාව ඒ සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගෙන තිබුණි. | ප්‍රතිලාභීන් වෙත පහසුකම් සැපයීම සඳහා ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු ළඟාකර ගැනීම අවශ්‍ය වේ. |
| (ආ) | රිදීගම බහුකාර්ය ගොඩනැගිල්ල සහ බස්නැවතුම් පොළ | අපේක්ෂිත ප්‍රතිලාභ ලඟා වී නොතිබුණි. | ව්‍යාපෘතිය යටතේ සියලුම ඉදිකිරීමේ කටයුතු සම්පූර්ණ කර ඇති අතර ඉදිකිරීම් කටයුතු නිම කිරීමෙන් පසු ප්‍රාදේශීය සභාව මහජනතාව සඳහා විවෘත කිරීමට එකග වී ඇත. | -එම- |
| (ඇ) | මාවතගම බස්නැවතුම් පොළ | පොදු මහජනතාව වෙත අපේක්ෂිත ප්‍රතිලාභ ලඟා නොවේ. | මාවතගම ඉදිකළ බස් නැවතුම එහි මෙහෙයුම් කටයුතු ආරම්භ කර නොමැත. | ඉදිකල ගොඩනැගිලි උපයෝජනයට පියවර ගත යුතුය. |
| (ඈ) | පොල්පිතිගම ජල සම්පාදන පද්ධතිය | ප්‍රදේශයේ පවුල් 1,700 සඳහා ජල සැපයුම් පහසුකම් නොමැත. | පොල්පිතිගම යෝජනා ක්‍රමය සඳහා ජල බවුසර මිලදී ගැනීමට පියවර ගෙන තිබුණි. | අපේක්ෂිත අරමුණු අත්කර ගැනීමට පියවර ගත යුතුය. |
| (ඉ) | මීගහකියුල බස්නැවතුම | පොදු මහජනතාවට අපේක්ෂිත ප්‍රතිලාභ නොලැබී තිබුණි. | ප්‍රවේශ මාර්ග ඉදිකිරීමට පියවර ගනිමින් පවතී. | බස්නැවතුම් පොළ භාවිතයට ගැනීමට ප්‍රවේශ මාර්ග ඉදිකිරීමට ප්‍රාදේශීය සභාවට සහය දීමට පියවර ගත යුතුය. |
| (ඊ) | බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාවේ සතිපොළ, බහුකාර්ය ගොඩනැගිල්ල, වැසිකිලි, ජල සම්පාදන පද්ධතිය | පොදු මහජනතාවට අපේක්ෂිත ප්‍රතිලාභ නොලැබේ. | ගොඩනැගිලිවල ඉදිකිරීම් කටයුතු අවසන් කර ප්‍රාදේශීය සභාව වෙත භාරදී ඇති අතර ප්‍රමාදයකින් තොරව කටයුතු ආරම්භ කිරීමට අමාත්‍යාංශය ප්‍රාදේශීය සභාව වෙත | අපේක්ෂිත අරමුණු සඳහා ගොඩනැගිලි සහ අනෙකුත් සංවර්ධන වැඩ භාවිතයට අවශ්‍ය පහසුකම් සැපයීමට පියවර ගත |

| | | | | |
|---|---|---|---|---|
| | | | අවධානය යොමු කර තිබුණි. අපේක්ෂිත අරමුණු සඳහා මෙම ගොඩනැගිලි භාවිතා කිරීම අදාළ ආයතනවල වගකීම වේ. | යුතුය. |
| (උ) | රත්තොට ප්‍රාදේශීය සභාවේ සතිපොළ | පොදු මහජනතාව වෙත අපේක්ෂිත ප්‍රතිලාභ ලභා වී නොතිබුණි. | වෙළෙන්දන් විසින් කරන ලද ඉල්ලීම් අනුව උප කුටිවලට වෙන්කිරීමට ප්‍රාදේශීය සභාව තීරණය කර තිබුණි. කුටි උප කොටස්වලට වෙන්කිරීම අවසන් කිරීමත් සමඟ සතිපොළෙහි කටයුතු ආරම්භ වේ. | අපේක්ෂිත අරමුණු සඳහා ගොඩනැගිල්ල යොදාගැනීමට පියවර ගත යුතුය. |
| (ඌ) | කිරම බස්නැවතුම් පොළ | පොදු මහජනතාව වෙත අපේක්ෂිත ප්‍රතිලාභ ලභා වී නොතිබුණි. | බස්නැවතුම් පොළ සඳහා ප්‍රවේශ මාර්ග 02 ක් ඉදිකිරීමට පියවර ගෙන තිබුණි. | බස්නැවතුම්පොළ භාවිතා කිරීම අවශ්‍යා පහසුකම් සැපයීමට පියවර ගත යුතුය. |
| (එ) | විල්ගමුව ආදාහනාගාරය | පොදු මහජනතාව වෙත අපේක්ෂිත ප්‍රතිලාභ ලභා වී නොතිබුණි. | ගොඩනැගිලිවල ඉදිකිරීම් කටයුතු අවසන් කර තිබුණු අතර ප්‍රාදේශීය සභාව වෙත භාරදී ඇති අතර ප්‍රමාදයකින් තොරව කටයුතු ආරම්භ කිරීමට අමාත්‍යාංශය ප්‍රාදේශීය සභාව වෙත අවධානය යොමු කර තිබුණි. අපේක්ෂිත අරමුණු සඳහා මෙම ගොඩනැගිලි භාවිතා කිරීම අදාළ ආයතනවල වගකීම වේ. | විල්ගමුව ප්‍රදේශයේ ආදාහනාගාරය ඉදිකිරීමේ අවශ්‍යතාවය හොඳින් ඇගයිය යුතු අතර ව්‍යාපෘතිය විසින් සපයන ලද අරමුදල් නාස්තියකින් තොරව උපයෝජනය කළ යුතුය. |
| (ඒ) | විල්ගමුව ජලසම්පාදන යෝජනා ක්‍රමය | ප්‍රදේශයේ පවුල් 350 සඳහා ජල සැපයුම් පහසුකම් නොමැත. | නිවැරදි කිරීමට පියවර ගෙන ඇත. | විශේෂඥයින්ගේ උපදෙස් ලබා ගැනීමට පියවර ගත යුතු අතර වැරදි නිවැරදි කළ යුතුය. |
| (ඔ) | දික්ලන්ද ජල සම්පාදන යෝජනා ක්‍රමය | පොදු මහජනතාව වෙත අපේක්ෂිත ප්‍රතිලාභ ළඟා වී නොතිබුණි. | ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් දෙන ලද උපදෙස් අනුව ජල පිරිපහදුව වෙනස් කිරීමට පියවර ගෙන ඇත. | අපේක්ෂිත අරමුණු සඳහා වත්කම් යොදාගැනීමට පියවර ගැනීම අවශ්‍යා වේ. |

| | | | | |
|---|---|---|---|---|
| (ඕ) | ඉපලෝගම සනීපාරක්ෂක මධස්ථානය | පොදු මහජනතාව වෙත අපේක්ෂිත ප්‍රතිලාභ ළඟා වී නොතිබුණි. | ජල සම්පාදන යෝජනා ක්‍රමය සම්පූර්ණ කිරීමෙන් පසු ක්‍රියාත්මක කිරීමට පියවර ගනු ලැබේ. | අපේක්ෂිත අරමුණු සඳහා වත්කම් යොදාගැනීමට පියවර ගැනීම අවශ්‍ය වේ. |
| (ක) | වැල්ලවාය ආදාහනාගාරය | පොදු මහජනතාව වෙත අපේක්ෂිත ප්‍රතිලාභ ළඟා වී නොතිබුණි. | අදාහනාගාරය භාවිතයට මහජනතාව දැනුවත් කිරීමට පියවර ගෙන ඇත. | විශේෂඥයින්ගේ උපදෙස් ලබා ගැනීමට පියවර ගත යුතු අතර වැරදි නිවැරදි කළ යුතුය. |

## 3.3 මතභේදයට තුඩුදෙන ගැටලු

--------------------------------

| විගණන ගැටලු | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|
| **(අ) වත්කම් කළමනාකරණ මෘදුකාංගය**<br>ඕස්ට්‍රේලියානු පෞද්ගලික සමාගමක් සමඟ 2018 දෙසැම්බර් 15 දින අත්සන් කරන ලද ගිවිසුම යටතේ පළාත් 07 ක ප්‍රාදේශීය සභා 07ක් සඳහා උප ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ. නියමු ව්‍යාපෘතියක් වශයෙන් වත්කම් කළමනාකරණ මෘදුකාංගයක්<br>නිර්මාණය කිරීම මෙම උපව්‍යාපෘතියේ අරමුණ විය. 2006 ජනවාරි 25 දිනැති අංක 08 දරන ජාතික ප්‍රසම්පාදන ආයතනයේ චක්‍රලේඛයේ අවශ්‍යතා පරිදි ප්‍රසම්පාදන භාවිතයක් නොමැතිව මෙම කොන්ත්‍රාත්තුව සඳහා විදේශ පෞද්ගලික සමාගම තෝරාගෙන ඇති බව නිරීක්ෂණය විය. ඉහත මෘදුකාංගයේ සහය ලබාදීම සහ නඩත්තු කිරීමේ ක්‍රමයක් ඉහත ගිවිසුමේ වගන්තිවල නොවූ බව තවදුරටත් අනාවරණය විය. තවද, ශ්‍රී ලංකාවේ පළාත් පාලන අංශයේ පවතින නීති සහ අත්පොත් පිළිබඳ ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර නොමැත. ඉහත ගිවිසුමේ වැඩ සැලැස්ම අනුව, 2019 දෙසැම්බර් 31 දිනට සැලසුම් කළ ආකාරයට ස්ථාපන කටයුතු සහ පුහුණු අත්පොත් සකස් කිරීම සහ කාර්යමණ්ඩල පුහුණු කිරීම් අවසන් කර නොතිබුණි. | ව්‍යාපෘතියේ අවශ්‍යතාවය පරිදි කටයුතු සකස් කර ඇති අතර ප්‍රසම්පාදන දැන්වීම ආසියානු සංවර්ධන බැංකුවේ වෙබ් අඩවියේ පළ කර ඇත. | ව්‍යාපෘතිය අවශ්‍ය ගුණාත්මකභාවය පවතින පරිදි කටයුතු කඩිනමින් නිම කිරීමට කොන්ත්‍රාත්කරු පෙළඹවීම අවශ්‍ය වේ. |

(ආ) වර්ෂයක් සදහා තාක්ෂණික විගණනයක් සිදු කිරීමට තනි පුද්ගල උපදේශකවරයෙකු ලෙස ඉංජිනේරුවෙකු තෝරාගෙන තිබුණි. පසුව ඔහුගේ කාලය 2019 නොවැම්බර් දක්වා දීර්ඝ කර තිබුණු අතර එකතුව රු.මිලියන 12.47ක් ගෙවා තිබුණි. අමාත්‍යංශ ලේකම් සහ තාක්ෂණික විගණන උපදේශක අතර අත්සන් කරන ලද ගිවිසුම අනුව, අවශ්‍ය ක්‍රියාකාරම් අඩංගු යොමුගත කිරීමේ අනුදේශ ඇතුළත් වාර්තාව සහ පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය විසින් කලින් කලට නිකුත් කරන මාර්ගෝපදේශ අනුව විගණනය සිදු කළ යුතු අතර අවශ්‍ය ක්‍රියාකාරම් අඩංගු යොමුගත කිරීමේ අනුදේශ ඇතුළත් වාර්තාව යටතේ නිර්වචනය කර ඇති පරිදි විවිධ අරමුණු හා කාර්යයන් පිළිබඳ විශේෂිත කොටස් ඇතුළත් කළ යුතු වේ. තාක්ෂණ විගණන උපදේශක අවසන් වාර්තාවේ ප්‍රධාන ගැටලු සහ නිර්දේශ වාර්තා කළ යුතු වුවද, වාර්තාවේ කිසිදු ප්‍රධාන ගැටලුවක් හෝ නිර්දේශයක් ඇතුළත් කර නොතිබුණි.

තාක්ෂණික විගණන උපදේශක ව්‍යාපෘති කළමනාකරණ ඒකකයට කොන්ත්‍රාත් ප්‍රසම්පාදනය සිදු කිරීමට සහාය ලබා දී ඇත.

ගෙවීම් නැවත අයකර ගැනීමට ව්‍යාපෘතිය කටයුතු කළ යුතුය.